සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | දේශපාලන විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
* **සියලුම** ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 - 2 | |
| 2 | 3 - 8 | |
| 3 | 9 - 14 | |
| 4 | 15 - 20 | |
| 5 | 21 - 25 | |
| 6 | 26 - 30 | |
| 7 | 31 - 40 | |
| 8 | 41 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

1. දේශපාලනය

(1) වෘත්තීය දේශපාලනඥයින්ට අදාළ වූවකි.
(2) සෘජුව රාජ්‍ය පාලනයට පමණක් සම්බන්ධ වූවකි.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට සීමා වූවකි.
(4) සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයකි.
(5) පොදු සමාජයෙන් ඈත්ව සිදුවන කටයුත්තකි. (......)

2. දේශපාලන විද්‍යාව,

(1) මානව සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය කරයි.
(2) දේශපාලනඥයින්ගේ චර්යාව අධ්‍යයනය කරයි.
(3) ප්‍රවේශ, න්‍යායන්, විධික්‍රම, බහුවිධය.
(4) අධ්‍යාත්මක ජීවිතය සඵල කර ගන්නකි.
(5) ක්‍රි.ව. 4 වන සියවසේ ආරම්භ වූවෙකි. (......)

3. සමාජ විද්‍යාත්මක අධ්‍යයන ප්‍රවේශයෙන් අවධාරණය කරන්නේ.

(1) දේශපාලනය කෙරෙහි සමාජ පදනම බලපාන බව.
(2) තර්ක බුද්ධිය යොදාගෙන දේශපාලනය හදාරන බව.
(3) සන්සන්දනය කිරීමෙන් දේශපාලනය හදාරන බව.
(4) දේශපාලනය කෙරෙහි ආර්ථිකය හේතුවන බව.
(5) දේශපාලනය පෞද්ගලික පරිමණ්ඩලය තුළ සිදුවන බව. (......)

4. දේශපාලන මතවාදය හා නිවැරදි සංකල්පය සහිත පිළිතුර තෝරන්න.

(1) ලිබරල්වාදය - රාජ්‍යය ආගමෙන් වෙන්කිරීම.
(2) සමාජවාදය - පොදු දේපල ක්‍රමය.
(3) ෆැසිස්ට්වාදය - පෞද්ගලික නිදහස.
(4) නිරාගමිකවාදය - මිශ්‍ර ආර්ථිකය.
(5) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය - රාජ්‍ය වන්දනය. (......)

5. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායයේ දැක්වෙන්නේ.

(1) රාජ්‍යය උපත ලබන්නේ ප්‍රාග්කොමියුනිස්ට් අවධියේය.
(2) රාජ්‍යය සාදාකාලිකව පවතින ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.
(3) රාජ්‍යය සුභසාධන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.
(4) රාජ්‍යය සමාජ සම්මුතියේ ප්‍රතිඵලයක් ලෙස උපදී.
(5) රාජ්‍යය ප්‍රජා පීඩක උපකරණයක් ලෙස ක්‍රියාත්මක වේ. (......)

6. ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමය (Autocracy).

(1) ආණ්ඩුවේ ත්‍රිවිධ බලතල පාලකයා වෙත සංකේන්ද්‍රනය වීම.
(2) ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ උපක්‍රමවලින් යුක්තය.
(3) පුද්ගලයින්ගේ සිවිල්, දේශපාලන සහ සමාජීය අයිතිවාසිකම් ආරක්ෂා වේ.
(4) නිසි වේලාවට නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වේ.
(5) මධ්‍යම ජාතික ආණ්ඩු විසින් පහළ මට්ටමේ ආයතන පාලනය කරයි. (......)

7. නව ලිබරල්වාදී රාජ්‍යය.

(1) 1940 - 1950 කාලවල ව්‍යාප්ත වූ රාජ්‍ය ප්‍රභේදයකි.
(2) රාජ්‍ය ව්‍යවසාය ආයතන පුද්ගලීකරණයට ලක්විය.
(3) ජෝන් ලොක්, ඇඩම් ස්මිත්, ඩේවිඩ් රිකාඩෝ න්‍යායාචාරීන් විය.
(4) ආර්ථික වශයෙන් රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්තිය අනුගමනය කරයි.
(5) රාජ්‍ය ව්‍යවසායකත්වට ප්‍රමුඛත්වයක් ලබා දෙයි. (......)

8. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය.

(1) විධායකය තුළින් ව්‍යවස්ථාධායකය තේරී පත්වේ.
(2) සාමූහික වගකීමේ සංකල්පය විරුද්ධ පක්ෂයට ප්‍රබලව බලපායි.
(3) කැබිනට් මණ්ඩලය තුළ නොඑකගතාවයන් පැවතියද බහුතර එකගතාවයෙන් පසු වගකීම සහිත වේ.
(4) ද්විත්ව විධායකින් යුක්ත වේ.
(5) බහු පක්ෂ ක්‍රමයක් මත ශක්තිමත් ආණ්ඩුවක් නිර්මාණය වේ. (......)

9. සන්ධීය ආණ්ඩුක්‍රමය.

(1) දුර්වල මධ්‍යම ආණ්ඩුව සන්ධීය භාවයේ මූලයයි.
(2) ඒකබලවාදී බල මෙහෙයවීමක් දැකිය හැකිය.
(3) අතිරේක ස්වාධිපති ආයතන නැත.
(4) අතිරේක බලතල මධ්‍යම ආණ්ඩුව සතුවිය යුතුය.
(5) ජාතික එක්සත්කම හා ප්‍රාදේශීය අනන්‍යතාවය එකවර ඉටුවේ. (......)

10. සමූහාණ්ඩුවාදය.

(1) පරමාධිපත්‍ය බලයේ හිමිකරු රජයයි.
(2) ග්‍රීක රෝම යුගයේ දී සමූහාණ්ඩුවාදය ප්‍රතික්ෂේප විය.
(3) පුරවැසියා දේශපාලන වශයෙන් නිද්‍රාශීලී වේ.
(4) හැනා ඇරෙන්ඩ්, ක්වෙන්ටින් ස්කිනර්, පිලිප් පෙටිට් 20 වන සියවසේ සමූහාණ්ඩුවාදයේ ප්‍රධාන ප්‍රකාශකයෝ විය.
(5) නිදහස රැක ගැනීමට පුරවැසියා සටන්කාමී වීම ප්‍රතික්ෂේප කොට ප්‍රතිසංස්කරණවාදය පිළිගනී. (......)

11. ස්ත්‍රීවාදය.

(1) කාන්තාවාදය ලෙස 16 වන සියවසේ දී ආරම්භ වූ මතවාදයකි.
(2) පෞද්ගලික පරිමණ්ඩලය තුළ දේශපාලනය ප්‍රතික්ෂේප කරන ලදී.
(3) යුරෝපය සහ ඇමරිකාව ප්‍රධාන පර්යේෂණාගාරය ලෙස පිළිගනී.
(4) රැඩිකල් ස්ත්‍රීවාදීන් පීතෘමූලිකත්වය ප්‍රතික්ෂේප කරයි.
(5) වර්ණය හා වර්ගය මත ස්ත්‍රිය පීඩාකාරී තත්වයකට පත්වන්නේ නැත. (......)

12. ගැටුම්

(1) රාජ්‍ය අභ්‍යන්තරයේ නිර්මාණාත්මක ගැටුම් මෙන්ම විනාශකාරී ගැටුම් ද ඇතිවේ.
(2) ගැටුමක සාධනීය පැතිකඩක් දැකිය නොහැකිය.
(3) ගැටුමක් හරහා සමාජය එක තැන පල්වේ.
(4) පුද්ගල අභ්‍යන්තර ගැටුම් පුද්ගල චර්යාවෙන් පෙන්නුම් නොකෙරේ.
(5) ගැටුමක උත්සන්නභාවයට එහි තීව්‍රතාවය අදාල නොවේ. (......)

13. සාමය ගොඩනැගීම.

(1) සහමන්ත්‍රණය සාමය ගොඩනැගීම අධෛර්යමත් කරයි.
(2) තුන්වන පාර්ශවයකගේ මැදිහත්වීම ප්‍රායෝගිකව ගැටුම්වලදී ඒතරම් සිදු නොවේ.
(3) සාම ක්‍රියාදාමය ධරණීය ක්‍රියාදාමයක් කරා යායුතු බව මහාචාර්ය ගැල්ටුං ප්‍රකාශ කරයි.
(4) කැරලිකාර පාර්ශව ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට අන්තර්ග්‍රහණය කරගැනීම කළ යුතුවේ.
(5) සාමය ගොඩනැගීමේ දී දේශපාලන ක්‍රියාමාර්ග සමග සමාජමය සුව කිරීම අත්‍යවශ්‍ය නොවේ. (......)

14. පුරවැසියා හා සම්බන්ධ නිවැරදි මතවාදය වන්නේ.

(1) ලිබරල්වාදය — නිදහස සහ අයිතිවාසිකම් සටන්කර අත්පත්කර ගනී.
(2) ෆැසිස්ට්වාදය — සංස්කෘතිය සමග පූර්ණ නිදහස භුක්තිවිඳී.
(3) සමාජවාදය — දේශපාලන මතය අභිමත පරිදි භුක්තිවිඳී.
(4) ජාතිකවාදය — නූතන ජාතික රාජ්‍යයේ සාමාජිකයන් සමග සමීප නොවේ.
(5) නිරාගමිකවාදය — දේශපාලනය, පෞද්ගලිකත්වය ආගමෙන් නිදහස් කරයි (......)

15. මානව අයිතිවාසිකම්.

(1) විශ්වීය සදාචාරාත්මක අයිතිවාසිකමක් නොවේ.
(2) පුරුෂයින්ට පමණක් හිමි විය යුතු අයිතිවාසිකමක් වේ.
(3) ජාත්‍යන්තර නීතියේ කොටසක් නොවේ.
(4) මනුෂ්‍යයෙකු, මනුෂ්‍යයෙකු වීම නිසාම හිමි වේ.
(5) රාජ්‍යයෙන් ආරක්ෂා කළ යුතු අයිතිවාසිකම් වේ. (......)

16. රාජ්‍ය ප්‍රතිපත්ති.

(1) ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ දේශපාලන විද්‍යාවේ සම්භාව්‍ය යුගයේදීය.
(2) බ්‍රිතාන්‍ය සමාජය ආශ්‍රයෙන් ශාස්ත්‍රීය ලෙස හැදෑරීම ආරම්භ වී ඇත.
(3) ප්‍රතිපත්ති හැදෑරීමට පමණක් සීමා වේ.
(4) පවතින්නේ ආණ්ඩුවේ යෙදවුම් වලටය.
(5) මහජනතාවගේ දුක් ගැනවිලි විසඳීම අරමුණු කරයි. (......)

17. ඇමරිකා එක්සත් ජනපද ජනාධිපතිවරයාට අදාළ ප්‍රකාශය වන්නේ.

(1) ජනතාවගේ සෘජු ඡන්දයෙන් තෝරා පත් කර ගැනේ.
(2) ඕනෑම වාර ගණනක් ධූරය දැරීමේ හැකියාව සහිතය.
(3) සෙනෙට් සභාවේ පාලනයට යටත්ය.
(4) යුද්ධය ප්‍රකාශ කිරීමේ බලය රහිතය.
(5) නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිල ප්‍රකාශකයා වේ. (......)

18. ඔබ අධ්‍යයනය කරන ආණ්ඩුක්‍රම මාදිලිවලට අදාළ වන්නේ.

| | | |
|---|---|---|
| (1) ඇමරිකා එක්සත් ජනපදය | ප්‍රාන්ත අතර බලය බෙදාහැර ඇත්තේ අසමමිතිකවය. | |
| (2) ඉන්දියාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉන්දියානු ආණ්ඩුක්‍රමය අර්ධසන්ධීය බව ප්‍රකාශ කරයි. | |
| (3) බ්‍රිතාන්‍ය | බ්‍රිතාන්‍ය රජ පාර්ලිමේන්තුවේ කොටසක් වේ. | |
| (4) ප්‍රංශය | ව්‍යවස්ථාව මගින් ඒකීය රාජ්‍යයක් බව ප්‍රකාශ කරයි. | |
| (5) ස්විට්සර්ලන්තය | හවුල් පාලනය සහ ස්වයං පාලනය යන මූලධර්ම මත පිහිටා ඇත. | (......) |

19. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂක්‍රමය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ.

(1) ආගමික හා වාර්ගික පදනමින් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ බිහිවීම ප්‍රධාන ලක්ෂණයකි.
(2) ශ්‍රී ලංකාවේ බිහිවූ පළමු දේශපාලන පක්ෂය දක්ශිණාංශික දේශපාලන පක්ෂය වේ.
(3) පූර්ව මැතිවරණ සන්ධාන ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය තුළ දක්නට නොලැබේ.
(4) ප්‍රමාණයෙන් හා පාර්ලිමේන්තු නියෝජනයෙන් කුඩා වාමාංශික පක්ෂද දක්නට ලැබේ.
(5) ශ්‍රී ලංකාවේ වාමාංශික පක්ෂවල දෘෂ්ටිවාදය සමාජවාදය නොවේ. (......)

20. ජාත්‍යන්තර දේශපාලනයට අදාළ වන්නේ.

(1) ඡන්දයෙන් ප්‍රශ්න විසඳන දේශපාලනය වේ.
(2) ස්වාධිපති බලය අතින් එක හා සමාන නොවේ.
(3) ආර්ථික රාජ්‍යය තාන්ත්‍රික සම්බන්ධතාවලට සීමා වේ.
(4) ආණ්ඩුවක් නොමැති දේශපාලනය ලෙසද හැඳින්වේ.
(5) සම්මුතිකාමී දේශපාලනය අධෛර්යමත් කරයි. (......)

අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුලත් වරණය තෝරන්න.

21. ශ්‍රී ලංකාවේ යටත්විජිත යුගයේ කෝල්බෲක් - කැමරන් නිර්දේශ වූයේ.

A - අනිවාර්ය සේවා භුක්ති ක්‍රමය අහෝසි කිරීම.
B - ඉඩම් සම්බන්ධ පෞද්ගලික අයිතිය හඳුන්වා දීම.
C - ව්‍යවස්ථාදායක සහ විධායක සභා හඳුන්වා දීම.
D - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
E - පොදු අධිකරණ ක්‍රමයක් හඳුන්වා දීම.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

22. 1910 සහ 1930 අතර හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ.

A - ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව වැඩි කළේය.
B - සීමිත ඡන්ද බලය පුළුල් කළේය.
C - ප්‍රාදේශීය නියෝජනය පුළුල් කළේය.
D - කථානායකවරයා වස්ථාදායක සභාවේ ප්‍රධානියා බවට පත් කළේය.
E - ලාංකිකයින්ට වැඩි බලතල ප්‍රමාණයක් ක්‍රමිකව පැවරීය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

23. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.

A - ඩොනමෝර් කොමිසමේ වාර්තාව මත පදනම් විය.
B - පූර්ණ වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලබා දුන්නේය.
C - මැතිවරණය සඳහා වර්ණ ඡන්ද පෙට්ටි ක්‍රමය හඳුන්වා දුන්නේය.
D - විධායක කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩලයක් හඳුන්වා දුන්නේය.
E - රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට වග නොකියයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

24. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ සෙනෙට් සභාව.

A - සාමාජිකයින් 30 දෙනෙකුගෙන් සමන්විත විය.
B - ප්‍රධානියා වූයේ කථානායකවරයාය.
C - ඇමරිකාවේ සෙනෙට් සභාවට සමාන නොවීය.
D - එකවර විසිර නොයන ලදී.
E - අධිකරණ අමාත්‍යවරයා තෝරා ගන්නා ලදී.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

25. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව පදනම් වූ මූලධර්ම වූයේ.

A - බලතල සංකේන්ද්‍රගත කිරීම.
B - ජනතා පරමාධිපත්‍ය.
C - ව්‍යවස්ථාදායකයේ උත්තරීතරත්වය.
D - සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය.
E - නිරාගාමිකවාදය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

අංක **26** සිට **30** දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| **අංකය** | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| (1) | සත්‍ය වේ | සත්‍ය වේ |
| (2) | සත්‍ය වේ | අසත්‍ය වේ |
| (3) | අසත්‍ය වේ | සත්‍ය වේ |
| (4) | අසත්‍ය වේ | අසත්‍ය වේ |
| (5) | සත්‍ය වේ | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 26. | ශ්‍රී ලංකාවේ 1978 මුල් ව්‍යවස්ථාවට අනුව සිංහල හා දෙමළ භාෂා දෙකම රාජ්‍යය භාෂා වන්නේය | ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව යටතේ සිංහල හා දෙමළ භාෂා දෙකම ජාතික භාෂා වන්නේය. (......) |
| 27. | ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවට සිදු කරන ලද 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයාගේ බලතල සීමා කරන ලදී. | ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවට සිදු කරන ලද 19 වන සංශෝධනය යටතේ ක්‍රියාත්මක වූ ආන්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ජනාධිපතිගේ විධායක පත්කිරීම් අනුමත කරන ලදී. (......) |
| 28. | ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වේ. | ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වූවද උත්තර දීමට බැඳී නැත. (......) |
| 29. | ශ්‍රී ලංකාවේ 1978 මුල් ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව සාමාජිකයින් 225 කින් සමන්විත වේ. | ශ්‍රී ලංකාවේ 1978 මුල් ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව පස් අවුරුදු නිලකාලයකින් යුක්ත වේ. (......) |
| 30. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරමාධිපත්‍ය බලය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය. | ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව යටතේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක කරන එකම ආයතනය පාර්ලිමේන්තුව විය. (......) |

### දර්ශනික B කොටස

31. සම්භාව්‍ය ප්‍රතිමානීය අධ්‍යයන ප්‍රවේශය භාවිත කළ දේශපාලන දාර්ශනිකයින් දෙදෙනා නම් කරන්න.
(1) ...............................................................................................................................
(2) ...............................................................................................................................

32. ආණ්ඩුකරණයට අයත් (Governance) ප්‍රධාන කාර්යයන් දෙකක් දක්වන්න.
(1) ...............................................................................................................................
(2) ...............................................................................................................................

33. සමාජයේ දේශපාලනය පවතින පැතිකඩ කිහිපයකි. ඉන් දෙකක් දක්වන්න.
(1) ...............................................................................................................................
(2) ...............................................................................................................................

34. පහත දේශපාලන න්‍යායන් ඉදිරිපත් කරන ලද දේශපාලන චින්තකයින් දක්වන්න.
(1) මහජන පරිමණ්ඩලය - ..........................................................................................
(2) යුක්තිය පිළිබඳ න්‍යාය - ..........................................................................................

35. ප්‍රජාතන්ත්‍රීය රාජ්‍යවල ආණ්ඩුවේ බලය සංවරණය කරන දේශපාලන ආයතන දෙකක් නම් කරන්න.
(1) ...............................................................................................................................
(2) ...............................................................................................................................

36. පහත ප්‍රකාශයන් සිදුකරන ලද දාර්ශනිකයින් දක්වන්න
(1) "රාජ්‍යය මනුෂ්‍ය සමාගමක් වන අතරම මනුෂ්‍යයන්ගේ ඉහළම පොදු යහපත වෙනුවෙන් ක්‍රියාකරන්නකි." - ...............................................................................................

(2) "රාජ්‍යය යනු නිශ්චිත භූමි ප්‍රදේශයක් ඇතුළත් බලහත්කාරී බලය සුජාත ලෙස පාවිච්චි කිරීමේ ඒකාධිකාරය තිබෙන්නේ තමන්ට පමණක් යැයි කියාපාන මනුෂ්‍ය ප්‍රජාවයි." - ...............................................................................................................................

37. ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවතින රාජ්‍යවල පරිපාලන බලය බෙදාහරින ආකාර කිහිපයකි. ඉන් දෙකක් නම් කරන්න.
(1) ...............................................................................................................................
(2) ...............................................................................................................................

38. පහත සඳහන් සාධක හේතු කොටගෙන සංඝීය භාවය බිහිවූ රාජ්‍යයක් බැගින් නම් කරන්න.
(1) භූගෝලීය සාධකය - ..........................................................................................
(2) දෘෂ්ටිමය සාධකය - ..........................................................................................

39. ජනාධිපති ආණ්ඩුක්‍රමයක විධායකය පත්කිරීමේ මැතිවරණය කුමක්ද? විධායකය ඉවත් කිරීමේ ක්‍රියාවලිය කුමක්ද ?.
(1) ...............................................................................................................................
(2) ...............................................................................................................................

40. ද්විත්ව විධායකය හෙවත් අර්ධ ජනාධිපති ක්‍රමය ක්‍රියාත්මක වන රාජ්‍යයන් දෙකක් නම් කරන්න.
(1) ...............................................................................................................................
(2) ...............................................................................................................................

41. නූතන ආණ්ඩුක්‍රමයන් තුළ ව්‍යවස්ථාදායකය සංවිධානය කිරීමේ ප්‍රධාන ආකෘති දෙක නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

42. ඇන්ඩෲ හේවුඩ් ප්‍රජාතන්ත්‍රවාදය ආකාර දෙකකින් දක්වා ඇත. එම ආකාර දෙක දක්වන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

43. මහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙක නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

44. 1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට මුල් වූ පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

45. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයේ දී ප්‍රථම මැතිවරණය පැවැත්වූ වර්ෂය නම් කරන්න. සීමිත ඡන්ද බලයෙන් පත්වූ සාමාජිකයින් ගණන නම් කරන්න.
(1) .........................................................
(2) .........................................................

46. ඩොනමෝර් අමාත්‍ය මණ්ඩලය ද්වි සංගතික වේ. එම කොටස් දෙක නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

47. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ආයතන දෙකක් නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

48. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ දෙකක් නම් කරන්න.
(1) .........................................................
(2) .........................................................

49. පාර ජාතික සංවිධාන දෙකක් නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

50. සමකාලීන ලෝක දේශපාලනයේ ප්‍රධාන ප්‍රවාහ දෙකක් නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................